




# තරුණ ගොවි සමාජ අරමුණක් වශයෙන් ආරම්භ වූ කුකුල් ව්‍යාපාරය

1958 වර්ෂයේදී තරුණ ගොවි සමාජ අරමුණක් වශයෙන් ආරම්භ වූ ගම්පොල කමලා ද සිල්වා මෙනවියගේ කුකුළන් ඇති කිරීමේ ව්‍යාපාරය අද දවස වටිනා සත්ව පාලන කටයුත්තක්වී තිබේ. දිනක් වයස් පැටවුන් කීප දෙනෙකුගෙන් ඉතා කුඩා අන්දමින් පටන්ගත් මෙය මෙවකට බිත්තර දමන කිකිළියන් 5,000ක් පමණ ඇති ව්‍යාපාරයකි. කෑමට ගන්නා බිත්තර විශාල සංඛ්‍යාවක් දිනපතා කොළඹට පටවා යවන මෙහි විශේෂ කාර්‍ය්‍යවී ඇත්තේ ඇති කිරීම සඳහා උසස් පෙළේ දිනක් වයස් කිකිළියන් නිෂ්පාදනයයි. සතුන් ඇතිකිරීමේ කටයුත්තක් වශයෙන් පෙරමුණ ගන්නා ''ෂෙට්නා කුකුල් ගොවිපළ'' බැලීමට හා එය පිහිටුවීමේ හා දියුණු කිරීමේ කාර්‍ය්‍යයට පළමුව ඉදිරිපත්වී කමලා ද සිල්වා මෙනවිය හමුවී කතා කිරීමටද මෑතදී අප පේරාදෙනියේ තරුණ ගොවි සමාජ මූලස්ථානයේ ගොවිකම් උපදේශක එස්. ශ්‍රී. කාන්තන් මහතා හා සමඟ ගියෙමු.

කමලා ද සිල්වා විසි වයස් තීරයේ ක්‍රියාශීලි දක්ෂ තරුණියෙකි. 1954–56 කාලයේදී කුණ්ඩසාලෙ කාන්තා කෘෂිකර්ම විද්‍යාලයේ දෑවුරුදු පුහුණුවක් ලත් ඇය ඉන්පසු තෙමසක කාලයක් ගුරුවරියක් වශයෙන් වැඩකර තිබේ. 1958

වර්ෂයේදී තරුණ ගොවි සමාජ ව්‍යාපාරයට බැඳුණු මැය තරුණ ගොවි අරමුණක් වශයෙන් කුකුළන් ඇති කිරීමට පා තැබුවේ එවකට ගම්පොල කෘෂිකර්ම උපදේශකව සිටි සෙබැස්ටියන් මහතාගේ උපදෙස් හා මඟ පෙන්වීම් අනුවයි. පළමු අවස්ථාවේදී ඇය විසින් ඇති කිරීම සඳහා ගොවිකම් දෙපාර්තමේන්තුවෙන් මිළදී ගන්නා ලද්දේ දිනක් වයස් කුකුල් පැටවුන් 30ක් පමණය. කුකුළ් පැටවුන් තිහකින් පාලනයට ඉදිරිපත් වූ කමලාගේ අරමුණ ඇයගේ විශාල උනන්දුව හා ක්‍රියාශීලි එඩිතර භාවය හේතුකොට ගෙන ක්‍රමයෙන් දියුණුවී ගියේය. ඒ අතර ඇයගේ දැනුමද එයාකාරයෙන්ම වැඩිවී ගියේය. පළාතේ ගොවිකම් ව්‍යාප්ති නිලධාරීන්ගෙන් ලබා ගත් උපකාර හා උපදෙස් මෙන්, පේරාදෙනියේ තරුණ ගොවි සමාජ මූලස්ථානයෙන් ලැබුණු ආධාරයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් කමලා දක්ෂ ගොවි තරුණියක් විය. ඇගේ ව්‍යාපාරය ආදර්ශමත් සත්ව පාලන කටයුත්තක් හා ආර්ථික ප්‍රයෝජනයක් සහිත කාර්‍යයක් ලෙසට පරිවර්තනය විය.

තරුණ ගොවි සමාජ කටයුතු ගැන හා තම ගොවි අරමුණ ගැනද නොකඩවා දක්වූ සැලකිල්ල නිසා ගොවිකම් දෙපාර්තමේන්තුව විසින් ඇය තරුණ ගොවි ශිෂ්‍යත්වයකට තෝරා ගන්නා ලදි. අමෙරිකා එක්සත් ජනපදයේ තරුණ සංවිධානයේ තරුණ ගොවි හුවමාරු ක්‍රමය යටතේ පිරිනැමුණු මෙම ශිෂ්‍යත්වය ලැබ් කමලා අමෙරිකාව බලා ගියේ 1963 මැයි 24 වන දිනදී ය. ඇය පෙරළා ආවේ මේ අවුරුද්දේ ජූනි මස 20 වන දිනයි.



කෑමට බිත්තර දමන කිකිළියන්ගේ ගෙයක් අසලදී

කුකුළන් ඇතිකිරීම ගැන මෙහිදී කමලා දැන සිටි දේවලට අමතරව තවද වටිනා අතිරේක කරුණු රාශියක් අමෙරිකාවේදී උගෙණීමට හැකි විය. අමෙරිකාවේ ගොවි පවුල් හා සමඟ ජීවත් වී ඔවුන්ගේ ගොවි කටයුතු හා සංස්කෘතිය ගැන ප්‍රායෝගික පුහුණුවක් ලබාගත් කමලා එහි මාස අටක් ගත කළේය. එයින් පළමු තෙමස ගත කළේ කැලිෆෝනියාවේය. මීළඟ තුන් මාසයේ කාලය ඇය සිටියේ ඉලිනොයි ජනපදයේ ගොවි පවුල් හා සමඟය. අවසාන දෙමස ඈ ගත කළේ නිව්යෝර්ක් ජනපදයේ ඉතාකාවේ පිහිටි බැබ්කොක් කුකුල් ගොවිපළේය. බැබ්කොක් කුකුල් ගොවිපල ඇයගේ ගම්පොල ෂෙට්නා කුකුල් ගොවිපලට බෝකිරීමේ සතුන් සපයන ගොවි ආයතනයයි. එබැවින් එහිදී කමලාට බැබ්කොක් නමැති වයිට් ලෙගෝන් කුකුල් වරිගය ගැන වටිනා කරුණු රාශියක් උගෙනීමට හැකි විය. උසස් පෙළේ කුකුල් වරිගයක් අභිජනනය කිරීම හා එවැනි උසස් වර්ගයක් එසේ උසස් තත්ත්වයකින් තබා ගැනීම යනාදී කරුණු රැසක් ඈ එහිදී උගෙනීය. ඒ අතර නවීන කුකුල් ගොවිපළක විශේෂාංග ඇය එහිදී දැක උගෙනගත්තේ ය.

අමෙරිකාවේ කුකුල් පාලන කටයුතු ගැන තමන්ගේ අදහස් ප්‍රකාශ කළ කමලා ඇය අප හා සමඟ මෙසේ කීය. ''අමෙරිකා එක්සත් ජනපදයේ කුකුළන් ඇති කිරීමේ කටයුතු සියල්ල යාන්ත්‍රිකය. එහි ගොවි නිවෙසක ඇති ඉතා කුඩා කුකුල් ව්‍යාපාරයක පවා බිත්තර දමන කිකිළියන් 20,000ක් පමණ සිටිති. ඒසා විශාල ව්‍යාපාරයක් පාලනය වන්නේ හා එහි ගොවි හා කම්කරු කටයුතු ඉටු කරන්නේ දෙදෙනෙකු ගෙනි. බොහෝ විට ගෙවිලිය හා ඇයගේ දුව පමණක් මෙම සම්පූර්ණ ව්‍යාපාරය රැකබලා ගනී. ගොවිපළේ කටයුතු කෙතරම් යාන්ත්‍රිකදැයි මෙයින් මැන ගැනීමට පිළිවන''.

අමෙරිකා එක්සත් ජනපදයේ අට මසක් පමණ ගත කළ කමලා, යුරෝපයට පැමිණ මාස හතරකට ආසන්න කාලයක් ගොවිපළ් බලමින් සංචාරය කළේය. එහිදී ඇය රටවල් 20කට පමණ ගොස් තිබේ. කුකුළන් ඇති කිරීම ගැන හා වෙනත් ගොවි කටයුතු ගැනද ඇය අමෙරිකාවේදී හා යුරෝපයේදී උගෙන ඇති දේ අති විශාලයි. සංචාරයෙන් හා ගොවි පුහුණුවෙන්ද කමලා රැස්කර ඇති දැනුම ඇයගේ ප්‍රයෝජනයට පමණක් සීමා නොකර දිවයිනේ සෙසු තරුණ තරුණියන් ගේද ප්‍රයෝජනය උදෙසා යොමු කරවීම සඳහා දැනට පේරාදෙණියේ තරුණ ගොවි සමාජ පිළිබඳ කෘෂිකර්ම නිලධාරි විසින් කටයුතු කර තිබෙයි.

කුකුල් පාලනය පිළිබඳ කමලා ද සිල්වා මෙනවියගේ දැනුම පුළුල්වූ ආකාරයට ම ඇයගේ කුකුළන් ඇති කිරීමේ අරමුණද දියුණුවී ගිය බව මෙහිදී සඳහන් කළ යුතුව තිබේ. පළමුව තනිව පටන්ගත් ඇයගේ අරමුණට ක්‍රමයෙන් ඇගේ අයියාත්, මල්ලීත්, නංගීත් සහභාගි කරවා ගන්නා ලදි. මෙම කාර්‍යයට ඇයගේ අයියාගේ සහභාගිය ලබා ගැනීමෙන් පසු එයට මූලික ධනයත්, ඊට නොදෙවෙනි නායකත්වයත් ලබා ගත හැකිවිය. අද දවස ෂෙට්නා කුකුල් ගොවිපළ පාලනය වන්නේ ඇයගේ අයියා වන ජී. ජිනදාස මහතා විසිනි. ඔහු එම කාර්‍යය ඉතා උසස් අන්දමින් ඉටු කරන බව විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබේ.




දිනක් වයස් පැටවුන් වර්ග කෙරේ

දැනට ගම්පොල ෂෙට්නා ගොවිපළෙහි බිත්තර දමන කිකිළියන් 5,000ක් පමණ ඇත. එයින් දහසකට අධික සංඛ්‍යාවක් ඇති කිරීම සඳහා ''රක්කවන බිත්තර ලබා ගන්නා සතුන්ය''. කෑමට බිත්තර ලබා ගන්නා කිකිළියන් වර්ෂයකදී 240කට අධික ගණනාවක් බිත්තර දමති. එම බිත්තර ගොවිපළේ සිට දිනපතා කොළඹට පටවා යවනු ලැබේ. කෑමට ගන්නා එම බිත්තර අලෙවි කරන්නේ එකක් ශත 22 ක් බැගින්ය. කෑමට ගන්නා බිත්තර අලෙවිය ෂෙට්නා ගොවිපළේ විශාල කාර්‍ය්‍යයක්වීද එහි ඉතා වැදගත්ම කටයුත්තවී ඇත්තේ දිනක් වයස් කිකිළියන් නිෂ්පාදනය කිරීමයි.

කෑමට බිත්තර ගන්නා කිකිළියන් දමා ඇති කුකුල් ගෙවල් මෙම ගොවිපළේම සැලැසුම් කර, නිෂ්පාදනය කළ ඒවා වෙති. එම ගෙවල් සාද ඇත්තේ හැකිතාක් අඩු කම්කරු කාලයක් වැයවී එදිනෙද කටයුතු කළ හැකි වන අයුරුය. එනම් අර්ධ ලෙස යාන්ත්‍රික වන පරිදිය. මෙම කුකුල් ගෙයක දිග අඩි 100කි. පළල අඩි 10කි. ගෙයි මැද ආහාර දැමීමට හා බිත්තර රැස් කිරීමට ඔබ මොබ ඇවිදීම සඳහා අඩි දෙකක මාර්ගයක් ඉතිරි කර තිබෙයි. සාමාන්‍ය '' ඩීප් ලිටර් '' කුකුල් ගෙයක වර්ග අඩි $2\frac{1}{2}$ක්, 3ක් ඉඩ දෙන නමුදු මෙහිදී ඉඩ සලසා ඇත්තේ වර්ග අඩි $\frac{7}{10}$ ක්, ලැබීමට පමණය. කිකිළියන් ගෙයිතුළ එතරම් ඝනවට දමා තිබෙයි. මෙහි කිකිළියන් ලගින්නේ කම්බිදැල් වලය. උන්ගේ බිත්තර දමන්නේද එම දැල් මතය. ඒවා හැඩයකට සවි කර ඇති බැවින් දමන බිත්තර සෙමින් පෙරළී, ඉදිරියට, එනම් ගෙයි ඇතුළ් පැත්තට එයි. ලැගුම් දැල්වලට පහතින් කිකිළියන්ගේ මල වැටීමට තැටි සවිකර තිබේ. එම තැටි පිටතට

ඇලවන පරිදි සවි කර ඇති බැවින් කුකුළ් බෙටි රැස්කරන්නේ ගෙයි පිටතින් සිටය. කුකුළ් කෑම දමන්නේ ඇතුල් පැත්තේ සම්පූර්ණ දුරම දුවන ආහාර භාජනයකටය. ඒ අතර වතුර සපයා ඇත්තේ පිටතින් ඇති වතුර භාජනයකටය. මෙම භාජනයට වතුර, නලයකින් එවයි. එහි ජලය නොකඩවා ඉතා සෙමින් දුවමින් තිබෙන හෙයින් කිකිළියන්ට ලැබෙන ජලය සැමවිට ඉතා පිරිසිදුව තිබෙන්නේය. මෙම කිකිළියන් දමන බිත්තර දුසිමකට වැය වන්නේ කුකුල් කෑම රාත්තල් 4½ක් පමණ බව කමලා කීය.

ෂෙට්නා කුකුළ් ගොවිපලේ විශේෂාංගය වන ඇති කිරීමේ දිනක් වයස් පැටවුන් අලෙවි කරනු ලබන්නේ රුපියල් 2 බැගිනි. මෙම සතුන් සියල්ල අමෙරිකා එක්සත් ජනපදයේ, නිව්යෝර්ක් ප්‍රාදේශීය රාජ්‍යයේ ඉතාකාහි පිහිටි සුප්‍රසිද්ධ බැබ්කොක් ගොවිපලේ බිහි කරන ලද වයිට් ලෙගෝන් කුකුළ් වර්ගයකි. ෂෙට්නා ගොවිපළට අමෙරිකාවෙන් ගෙන්වා ගන්නේ දිනක් වයස් කිකිළියන්ය. වරෙකට බැබ්කොක් වරිගයේ පැටවුන් දහසක් ගෙන්වන අතර එවැනි තොගයක් මාස අටෙන් අටට ගෙන්වා ගනු ලැබෙයි. අමෙරිකාවේ සිට ගෙන එන සෑම කිකිළි පැටවෙකු වෙනුවෙන් මෙම ගොවිපළට රුපියල් 12/50ක් පමණ වැය වේ. අමෙරිකාවේ සිට ගුවන් යානාවෙන් එවන මෙම පැටවුන් දින 3කදී ෂෙට්නා ගොවිපළට ළඟාවේ. දිනක් වයස් පැටවුන් පැය 72ක්ම ආහාර හෝ වතුර නොමැතිව සුවසේ සිටිය හැකි බැවින් උන් ඉතා නිරෝගී තත්ත්වයකින් ලංකාව ට පැමිණෙයි. මෙම බැබ්කොක් කිකිළි පැටවුන් කමලා ද සිල්වා මෙනවියගේ හා ඇයගේ සහෝදර සහෝදරියන්ගේ ෂෙට්නා ගොවිපලේ අභිජනනය සතුන් වන්නේය.

රැක්කවීම සඳහා බිත්තර ලබා ගන්නා සෑම කිකිළියක්ම අමෙරිකාවෙන් ලබා ගත් බැබ්කොක් සතෙකු බැවින් එම ගොවිපළෙන් පිටවන දිනක් වයස් පැටවුන් සියල්ල සැමවිට උසස් ගුණාංගයන් පෙන්වති.

ෂෙට්නා ගොවිපලේ රැක්කවීමට බිත්තර ලබා ගන්නා සතුන් සියල්ල ඉතා හොඳින් රැක බලා ගනු ලැබෙයි. උන් හැම සතාම වෙනුවෙන් බිත්තර දැමීමේ පෞද්ගලික වාර්තා තබා ඇත. රැක්කවීම සඳහා ගනු ලබන්නේ උසස් ලෙස බිත්තර දමන සතුන් ගේ බිත්තර පමණය. නවීන කුකුළ් අභිජනනය ගොවි පළක ඉටුවිය යුතු සෑම කාර්‍යයම ෂෙට්නා ගොවිපලේ අභිජනනය අංශයෙහි උසස් අන්දමින් ඉටු වෙයි. රැක්කවීමේ බිත්තර ලබා ගන්නා කිකිළියන් සාමාන්‍ය වශයෙන් මාස 20ක් හෝ ඊට මදක් වැඩි කාලයක් තබා ගන්නා නමුදු කෑමට බිත්තර ගන්නා සතුන් තබා ගන්නේ මාස 18ක් පමණය. ඒ අතර රැක්ක වීමේ බිත්තර ලබා ගන්නා අභිජනනක කිකිළියන් හා කෑමට බිත්තර ලබා ගන්නා කිකිළියන්ද කුකුළ් ගෙවල ඉතා ඝන ලෙස ඇති කෙරෙන බැවින් උන් සියල්ලගේම හොටවල් කපා ඇත. එසේ කරන්නේ එකිනෙකා කොටා ගැනීම වැළැක්වීමටය.

මෙම කුකුළ් ව්‍යාපාරය බැලීමට අප එහි ගිය විට එහි බිත්තර රක්කවීමේ සුවිශාල ඉන්කියුබේටර් යන්ත්‍ර එකක් තිබුණි. වරෙකට බිත්තර 12,000ක් ඇහිරිය හැකි මෙය ''ගෙන්කේයි'' නමැති ජපන් ඉන්කියුබේටර් යන්ත්‍රයයි. ඒ අතර වරෙකට 16,000ක් රක්කවීමට පිළිවන් මෙයටද වඩා විශාල යන්ත්‍රයක් ළඟදීම ගොවිපළට ගෙන්වා ගැනීමට විධිවිධාන යොද ඇති බව අප කමලාගෙන් ඇසීමු.



කමලා ද සිල්වා මෙනෙවිය හා කුකුළ් ගෙයක රැස්වූ බිත්තර

සතියකට වරක් ඉන්කියුබේටර් යන්ත්‍රයෙන් කුකුළ් පැටවුන් තොගයක් පිටවන පරිදි යන්ත්‍රයට බිත්තර දැමීම සංවිධානය කර තිබේ. පැටවුන් තොගය පිට වන්නේ ඉරිද දිනයෙහිය. පැටවුන් ගැනුම් කරුවන්ට යවන්නේ සඳුද උදයේ දුම්රියෙන්ය. ඉරිද රාත්‍රී පැටවුන් යන්ත්‍රානුසාරයෙන් ගැහැණු පිරිමි බව සොයා තේරීම කරනු ලැබේ. වර්ග කිරීම කරන්නේ කමලාගේ අයියා ජිනදස මහතා විසිනි. ඔහු මේ ගැන විශේෂඥයෙකුවී සිටියි. ඔහුට පැයකදී පැටවුන් 400ක් වර්ග කළ හැකිය. වර්ග කිරීමේදී ජිනදස මහතා සියයට 95ක නිවැරදිතාවයක් ලබා ගනී. එය උසස් වේගයක් හා ප්‍රමාණයකි. ඒ අතර පැටවුන් වයස සති 12ක් පසුවූ විට උන්ගේ හොට කැපීමද කරන්නේ ජිනදස මහතාය. එපමණක් නොව කුකුළ් ගොවිපළේ සාමාන්‍ය සනීපාරක්ෂක කටයුතු සියල්ල පිළිබඳ ජිනදස මහතාට මනා දැනුමක් ඇති බැවින් එහි විශේෂඥ කටයුතු සියල්ල ඉටුවන්නේ ඔහු අතිනි.

කමලා ද සිල්වා මෙනවිය ගැන ලියන මෙම ලිපිය, ඇයගේ සහෝදර සහෝදරියන් ගැන යමක් නොලියා සම්පූර්ණ නොවෙයි. මෙම උද්යෝගිමත් සහෝදර සහෝදරියන් උපන් හපන්කම් අප හා සමග විස්තර කළේ තරුණ ගොවි සමාජ මූලස්ථානයේ ගොවිකම් උපදේශක එස්. ශ්‍රී. කාන්තන් මහතා අප ගොවිපළ බලා පෙරළා එන විටයි. ''කමලා උනන්දුව හා උද්යෝගය ඇති තරුණියකි. ඇය කුකුළන් ඇති කිරීමට මෙන් ගොවිසමාජ කටයුතු වලටද ආශාවක් හා දක්ෂකමක් දක්වන්නියකි. අමෙරිකා සහ යුරෝපා ගමනෙන් පසු ඇගේ

දැනුම බෙහෙවින් පුළුල් වී ඇති අතර ඇයගේ එඩිතර භාවයද අතිශයින් දියුණු වී තිබෙයි. කමලාගේ අයියා මෙම ව්‍යාපාරයට සම්බන්ධවීමෙන් පසු එයට ස්ථිර පදනමක් හා නායකයෙකුද ලැබී තිබෙයි. සියුම් වැඩවලට සමත්කමක් දක්වන ඔහු අළුත් කටයුත්තකට පා තැබීමට බියක් නොදක්වන්නෙකි. නො එසේ නම් වටිනා රජයේ රැකියාවක සිටි ඔහු එය අතහැර මෙම ව්‍යාපාරයට නොබැඳේ. කමලාගේ නංගී අතින් ගොවිපළේ සෑම ප්‍රායෝගික කාර්‍යයම ඉටුවන බැවින් ඈ එහි කළමණාකාරිය යයි හඳුන්වා දීමට පිළිවන. කුකුළ් ගොවිපළක ඇති කටයුතු සියල්ල ඇය හොඳාකාරව දනී. හොඳාකාරව ඉටු කරයි. අඩුපාඩුවක් තිබේ නම් ඇය අමුත්තන් ඉදිරිපිට පැකිළීමක් දැක්වීම පමණයි. කමලාගේ මල්ලී අත්වැඩ හා නිර්මාණාත්මක වැඩවලට විශේෂ දක්ෂතාවක් ඇති අයෙකි. ගොවිපලේ බොහෝ භාණ්ඩ ඔහු අතින් සැදුණු ඒවාය. අළුත් කුකුළ් ගෙවල්වලින් සමහරක් සම්පූර්ණ වශයෙන් සාදන ලද්දේ ඔහු විසිනි. චිත්‍ර ඇඳීමට පවා ඔහු ඉතා දක්ෂය''යි ශ්‍රී කාන්තන් මහතා කීවේ කමලා ගේ ගෙයි සාලයේ තුබූ චිත්‍රයක් ගැන අපට මතක් කරදෙමින්ය.